ජාතික රක්ෂණ භාර අරමුදල - 2020

1. මූල්‍ය ප්‍රකාශන

1.1 ව්‍යාවනය කළ මතය

ජාතික රක්ෂණ භාර අරමුදල 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

1.2 ව්‍යාවනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය ව්‍යාවනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකාරීත්වය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ ව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතී රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ.) පහත සඳහන් හේතූන් නිසා දුර්වල පාලන පරිසරයක් නිරීක්ෂණය විය.<br>**(i)** ආයතනයේ ප්‍රධාන කළමනාකරණ තනතුරු හතරින් (04) තනතුරු තුනක් (03) පුරප්පාඩු ලෙස පවතී. අදාළ නිළධාරීන්ගේ ස්ථිර වගකීම්වලට අමතරව ප්‍රධාන විධායක | කෙසේ වෙතත්, ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනයේ සුමට ක්‍රියාකාරීත්වය සඳහා එම පුරප්පාඩු පිරවීම අත්‍යවශ්‍ය වුවද, ආයතනය විසින් ජීව ගණක කළමනාකරු සහ අවදානම් ඉංජිනේරුවන් සඳහා බඳවා ගැනීමේ ක්‍රියාවලීන් සිදු කර ඇත. | ප්‍රධාන කළමනාකරණ තනතුරු පිරවීමට සහ පාලන පරිසරය ශක්තිමත් කිරීමට කළමනාකාරිත්වය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

නිලධාරී සහ සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය යන තනතුරු සඳහා වැඩබලන පදනමින් නිළධාරීන් අනුයුක්ත කර තිබුණි. සහකාර සාමාන්‍යාධිකාරී - මෙහෙයුම් තනතුර 2016 නොවැම්බර් 01 වන දින, එනම් සේවක සංඛ්‍යාව අනුමත කළ දින සිට පුරප්පාඩුව පවතී. තව දුරටත්, කළමනාකාර තනතුරු හත (07) න් තනතුරු පහක් (05) පුරප්පාඩු වී තිබූ අතර කළමනාකාර තනතුරු තුනක් (03) අදාළ නිළධාරීන් ගේ ස්ථිර වගකීම්වලට අමතරව වැඩබලන පදනම මත පුරවා තිබුණි. එබැවින් අභ්‍යන්තර පාලනයන් වර්ධනය කිරීමේ හැකියාව, අභ්‍යන්තර පාලන පද්ධතිය ඵලදායි ලෙස අධීක්ෂණය කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා වන හැකියාව අවම වේ.

ජාතික රක්ෂණ භාර අරමුදල විසින් "කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2016" අනුගමනය කළ යුතු බැවින්, කර්මාන්තය හා සසඳන විට ජාතික රක්ෂණ භාර අරමුදල විසින් පිරිනමන අඩු වැටුප් පරිමාණයන් හේතුවෙන් මෙම පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇත. තව දුරටත් රජය විසින් සියලුම බඳවා ගැනීම් 2019 වර්ෂයේ සිට නතර කරනු ලැබ ඇත. ආයතනික සැලැස්මට අනුව අනාගත මෙහෙයුම් අවශ්‍යතා පරිදි එම පුරප්පාඩු පිරවීමට ජාතික රක්ෂණ භාර අරමුදල අපේක්ෂා කරනු ලබන අතර පවතින රෙගුලාසි යටතේ බඳවා ගැනීම සඳහා අමාත්‍යාංශයෙන් විශේෂ අනුමැතියක් ලබා ගත යුතුය.

**(ii)** බඳවා ගැනීමේ පටිපාටියේ දක්වා ඇති වගකිව යුතු අංශ සහ එම කාර්යයන් ඉටු කිරීම සඳහා සුදුසු කුසලතා ඇති නිළධාරීන් නොමැති වීම හේතුවෙන් ජීව සණක ක්‍රියාවලිය, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, ආයෝජන ක්‍රියාවලිය සහ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලිය ඵලදායි ලෙස සිදු කර නොතිබූ බව නිරීක්ෂණය විය. එබැවින්, අවදානම් කාලෝචිත ලෙස හඳුනා ගැනීම සහ එම අවදානම් අවම කිරීම සඳහා උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම, ජීව සණක ඇස්තමේන්තු කිරීම සඳහා නිවැරදි තොරතුරු සැපයීම ඵලදායී නොවිය හැක.

ජීව සණක ක්‍රියාවලිය, අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය, ආයෝජන ක්‍රියාවලිය සඳහා කැපවූ කාර්ය මණ්ඩලයකින් පුරවා නොතිබුණද, එම කාර්යයන් සාර්ථකව හා ඵලදායි ලෙස සිදු නොකළ බවක් හෝ කිසිසේත් ක්‍රියාත්මක නොවූ බවක් අදහස් නොවන බව සඳහන් කළ යුතුය. ජීව සණක ක්‍රියාවලිය සඳහා බාහිර පාර්ශවයකගේ සහය ලබා ගනී. ඒ අනුව, ජීව සණක කාර්යය සඳහා දේශීය මෙන්ම ගෝලීය සන්දර්භය තුළ ප්‍රමුඛතම ක්‍රියාකාරී සමාගමක් වන M/s NMG කන්සල්ටන්ට් පුද්ගලික සමාගමට ලබා දී ඇත. මූල්‍ය අංශයේ සහය ඇතිව සිදු වී ඇති නමුත් තවමත් වාර්තා කර නොමැති හිමිකම් වගකීම (IBNR) තක්සේරු කිරීම සහ ණය ගෙවිය හැකි බව, අවදානම් මත පදනම් වූ ප්‍රාග්ධනය (RBC ) සහ රක්ෂණ නියාමනය කොමිෂන් සභාව වෙත අවශ්‍ය අනෙකුත් සහතික කිරීම් ඇතුළු නියාමන වාර්තාකරණයට ඔවුන් ඵලදායී ලෙස සම්බන්ධ වේ. රක්ෂණ නියාමන කොමිෂන් සභාව පවා ජාතික රක්ෂණ භාර අරමුදල වෙතින් කාර්යයේ ඵලදායී ක්‍රියාකාරීත්වය පිළිබඳව මෙතෙක් ප්‍රශ්න කර නොමැත.

ආයෝජන කාර්යයන්- ජාතික රක්ෂණ භාර අරමුදල සඳහා පනතට අනුව ආයෝජනය

එම කාර්යයන් ඵලදායී ලෙස පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය සම්පත් සහිතව එම ප්‍රධාන අංශ පිහිටුවීමට

කළමනාකාරීත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය

.

| | | |
|---|---|---|
| | කළ හැක්කේ රජයේ සුරැකුම්පත්වල පමණි. එය සංකීර්ණ නොවන ආයෝජන කාර්යයකි. එබැවින්, ජාතික රක්ෂණ භාර අරමුදල "අවදානම කාලෝචිත ලෙස හඳුනා ගැනීම සහ එම අවදානම අවම කිරීම සඳහා උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම, ජීව සණක ඇස්තමේන්තු කිරීම්වලට අදාළ නිවැරදි තොරතුරු සැපයීම කළ නොහැක" යන කාරණා ප්‍රතික්ෂේප කරනු ලැබේ.<br>කැපවූ කාර්ය මණ්ඩලයක් සිටීමේ වටිනාකම අප දන්නා අතර පුරප්පාඩු පිරවීම සඳහා දැනටමත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.<br>කෙසේ වෙතත්, ඉහත පෙන්වා දුන් පරිදි, රටේ වත්මන් තත්ත්වය සහ වැදගත්ම දෙය ජාතික රක්ෂණ භාර අරමුදල හි අඩු වැටුප් පරිමාණයන් සුදුසු මානව ප්‍රග්ධනය ආකර්ෂණය කර ගැනීම ප්‍රමාද කිරීමට අහිතකර ලෙස බලපා ඇත. | |
| (iii) 2020 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සහ විගණන කමිටුවක් ක්‍රියාත්මක කර නොතිබුණි. එබැවින්, අභ්‍යන්තර පාලන පද්ධති නිරන්තරව සමාලෝචනය සහ ඇගයීම, ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම සිදු කර නොතිබුණි. | මෙම අංශයේ ප්‍රධානියාගේ පුරප්පාඩුව හේතුවෙන් අභ්‍යන්තර විගණනය හා විගණන කමිටුව ක්‍රියාත්මක නොවූ බවට ජාතික රක්ෂණ භාර අරමුදල එකඟ වේ. 2020 වර්ෂය තුළ පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අදාළ තනතුර පිරවීම සහ විගණන කමිටුවේ පැවැත්වීම ප්‍රමාද විය. | විගණන කමිටුවේ ඵලදායී ක්‍රියාකාරීත්වය කළමනාකාරීත්වය විසින් සහතික කළ යුතුය |
| (iv) අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමයේ සේවකයකු විසින් සිදු කරන ලද වංචාවක් 2022 ඔක්තෝබර් මාසයේදී අහම්බෙන් අනාවරණය වී ඇත. මෙම වංචාව 2018 වර්ෂයේ සිට සිදු කර ඇති අතර අභ්‍යන්තර විගණන වාර්තාවට අනුව අනාවරණය වූ මූල්‍ය පාඩුව රු. 5,136,000 කි. නිසි සුපරීක්ෂණයක් සහ අධීක්ෂණයක් සහිතව අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් ලෙස සැලසුම් කර ක්‍රියාත්මක නොකිරීම නිසා මෙය සිදු වී ඇති බව නිරීක්ෂණය වේ. තවද, අරමුදල සඳහා ශක්තිමත් පාලන පරිසරයක් නොමැති බව මෙයින් පැහැදිලි වේ. | කළමනාකාරීත්වය විසින් පිළිතුරු ලබා දී නොමැත. | වංචා අවදානම අවම කිරීමට සහ වංචා වළක්වා ගැනීමට කළමනාකාරීත්වය විසින් නිසි අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක කිරීම සහතික කළ යුතුය |
| (ආ.) අග්‍රහාර හිමිකම් ඉල්ලුම්පත්‍ර භාරගැනීමේ සිට හිමිකම් පියවීම දක්වා සහ අග්‍රහාර හිමිකම්වල බැරකම් හඳුනාගැනීම සඳහා, හිමිකම් කළමනාකරණය කිරීමේ ඒකාබද්ධ පද්ධතියක් අරමුදලට නොතිබුණි | නිරීක්ෂණය සමඟ එකඟ විය. කෙසේ වෙතත්, අග්‍රහාර හිමිකම් අංශය ක්‍රියාත්මක වන්නේ හිමිකම් ක්‍රියාවලියේ ප්‍රථම අදියර වන හිමිකම් වගකීම් භාර ගැනීම සහ හඳුනා ගැනීම හැර ඒකාබද්ධ පද්ධතියක් මඟිනි. හිමිකම් සැකසුම් පද්ධති වෙනස් කිරීම්වල | අග්‍රහාර රක්ෂණ ක්‍රමය සඳහා නිසි අභ්‍යන්තර පාලනයක් හඳුන්වා දීමට කළමනාකාරීත්වය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| | මෙම ආරම්භක අදියර 2022- 2025 ආයතනික සැලැස්මේ සලකා බැලූ අතර එය දැනට ප්‍රගතියක් ලබමින් පවතී. | |
| ඇ.) වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදී අරමුදලේ ***(SRCC* සහ *Tr* අරමුදල)** ගනුදෙනු මූලාශ්‍ර ලේඛන භාවිතා කරමින් පැතුරුම්පත්වල සටහන් කර ඇති අතර වසර අවසානයේදී පැතුරුම් පත්වල සටහන් වූ සියලුම ගනුදෙනු අතින් සකස් කළ ලෙජරයකට පිටපත් කර විගණනයට ඉදිරිපත් කර ඇත. 2019 වර්ෂයේදී අරමුදල ගිණුම් තැබීම සඳහා භාවිතා කරන "සේජ්" ගිණුම්කරණ පද්ධතිය තුළ මෙම පහසුකම සපයා තිබුණද, එම පහසුකම වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදී අරමුදලේ මූලාශ්‍ර වාර්තාකරණ ක්‍රියාවලිය සඳහා යොදාගෙන නොතිබුණි. | වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදී අරමුදල විසින් ගිණුම්කරණය සඳහා ගනුදෙනු අතින් සකස් කිරීම සහ SAGE ගිණුම්කරණ පද්ධතිය භාවිතය එකවර සිදුකරන ලදී. 2020 වර්ෂයේදී වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදී අරමුදල (SRCC & TC) විසින් ගිණුම්කරණය සඳහා සේජ් (SAGE) ගිණුම්කරණ පද්ධතිය මුළු වසර සඳහාම සම්පූර්ණයෙන්ම භාවිතා කරන ලදී. විගණකවරුන්ට ලබා දී ඇති එම පරිශීලක හැඳුනුම්පත සහ මුරපදය හරහා පද්ධතිය පරීක්ෂා කිරීම සඳහා පද්ධති ප්‍රවේශය ලබා ගත හැකිය. | මූලාශ්‍ර තොරතුරු පද්ධති කාලානුරූපව යාවත්කාලීන කිරීම සහ තොරතුරු වල අඛණ්ඩතාව (Integrity) සහතික කිරීම කළමනාකාරීත්වය විසින් සහතික කළ යුතුය. . |
| (ඈ) අග්‍රහාර රක්ෂණාවරණයේ වාරික මුදල් ගෙවීමේදී සහ හිමිකම් පෑමේදී සාමාන්‍ය, රිදී සහ රන් යෝජනාක්‍රම තුනම සඳහා එක් ආදායම් සහ එක් වියදම් අයිතමයක් වශයෙන් මූලාශ්‍ර ප්‍රකාශනවල හඳුනාගෙන තිබුණි. නිසි සහ යාවත්කාලීන දත්ත පද්ධතියක් නොමැති බැවින්, අරමුදලට කරන ලද දායක මුදල්, එක් එක් අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමවලින් ගෙවන ලද හිමිකම් පෑම් සඳහා සාක්ෂි ලබා ගැනීම මෙන්ම එක් එක් ආයතනය විසින් සහ එක් එක් රක්ෂණ ඔප්පු හිමියා විසින් රක්ෂණ අරමුදල වෙත මාසිකව කරන ලද දායක මුදල් පිළිබඳ සවිස්තර වාර්තාවක් ලබා ගැනීම දුෂ්කර ය. | සවිස්තරාත්මක යාවත්කාලීන දත්ත පදනමක් නොමැතිකම යන පදනම මත නිරීක්ෂණ සමග එකඟ විය. කෙසේ වෙතත්, පවතින ක්‍රමය තුළ, ආයතන කිහිපයක් හැර අග්‍රහාර සාමාන්‍ය, රිදී සහ රන් වාරික වෙන වෙනම ලබා දිය හැකිය. කෙසේ වෙතත් මුදල් අමාත්‍යාංශයේ අනුග්‍රහය ඇතිව නව සවිස්තරාත්මක තොරතුරු පද්ධතියක් ක්‍රියාත්මක කර ඇති අතර එය නුදුරු අනාගතයේ දී ක්‍රියාත්මක වනු ඇත. | අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා වාරික එකතු කිරීම සහ හිමිකම් සැකසීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් සහතික කිරීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ.) ප්‍රතිරක්ෂණ අංශය සඳහා හිමිකම් පෑම් සම්බන්ධ ගනුදෙනු කළමනාකරණය සහ වාර්තා තබා ගැනීම සඳහා නිසි පද්ධතියක් නොමැත. | ප්‍රතිරක්ෂණය කොටසෙහි හිමිකම් හැසිරවීමේ ක්‍රියාවලිය සඳහා නිරීක්ෂණය සමග එකඟ විය. Sage ACCPAC හි ලැබිය යුතු ගිණුම් මොඩියුලය දැනට ප්‍රතිරක්ෂණ ක්‍රියාවලීන් සඳහා ක්‍රියාත්මක වේ. තවද, 2022-2025 ආයතනික සැලැස්මට අනුව ප්‍රතිරක්ෂණය අංශයේ හිමිකම් හැසිරවීම සඳහා ජාතික රක්ෂණ භාර අරමුදල දැනට ක්‍රියාවලියක් සංවර්ධනය කරමින් සිටී. | ඵලදායී වාර්තාකරණ පද්ධතියක් ක්‍රියාත්මක වන බවට කළමනාකාරිත්වය සහතික විය යුතුය |

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ.) LKAS 8 - **ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් සහ දෝෂ**<br>කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙන් (AAIB) කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා ලැබුණු රුපියල් 148,380,847 මුදලක ප්‍රතිරක්ෂණ වාරිකය 2019 වර්ෂයේදී දළ ලිඛිත වාරිකය (gross written premium) සඳහා හඳුනාගෙන ඇත. තවදුරටත් ජාතික රක්ෂණ භාර අරමුදලට මෙම ගෙවීම භාර ගැනීමට නීතිමය බලයක් නොමැති බැවින් මෙම ආදායම 2020 වර්ෂයේදී කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත ආපසු ලබා දී ඇත . ශ්‍රී.ලං.ගි.ප්‍ර අංක 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් හා වැරදි ප්‍රමිතයෙහි 42 වැනි ඡේදයට අනුව, දෝෂය සිදු වූ 2019 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද සංසන්දනාත්මක ප්‍රමාණයන් නැවත සංශෝධනය කර දැක්වීමෙන් සමාලෝචිත කාල සීමාව තුළ මෙම දෝෂ නිවැරදි කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල ගැළපීමක් කර නොතිබුණි. | කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ ඉල්ලීම මත, ජාතික රක්ෂණ භාර අරමුදල විසින් කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත ලබා දුන් ප්‍රතිරක්ෂණ බෝග සමුච්චිත අතිරික්ත අලාභ ප්‍රතිරක්ෂණ ආවරණයේ (reinsurance crop aggregate excess of loss reinsurance cover) දීර්ඝ කිරීම පිළිගෙන ඇත.<br>ඒ අනුව, 2019 වසරේ ලැබුණු මුළු වාරිකය රුපියල් 148,380,8471 කි. මේ අතරතුර ජාතික රක්ෂණ භාර අරමුදලේ අධ්‍යක්ෂක මණ්ඩලය මුදල් අමාත්‍යාංශයෙන් අනුමැතිය ලබා ගන්නා ලෙස උපදෙස් ලබා දී ඇත. අරමුදල සම්පූර්ණයෙන් ආපසු ගෙවීමට 1210812020 දින අධ්‍යක්ෂක මණ්ඩලය විසින් තීරණය කරන ලදී. ඒ අනුව, කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත 2S/0912020 මත අරමුදල් ආපසු ගෙවන ලදී. යෝජිත පරිදි සංසන්දනය නැවත දැක්වීමට මෙය ගිණුම්කරණ දෝෂයක් නොවන බව කරුණාවෙන් සලකන්න | කළමනාකාරිත්වය විසින් මූල්‍ය ප්‍රකාශනවල ඇති ප්‍රමාණාත්මක, පූර්ව කාලපරිච්ඡේද දෝෂ අතීතයට බලපාන (retrospectively) පරිදි ගැළපිය යුතුය. |
| (ආ.) **ශ්‍රී.ලං.ගි.ප්‍ර අංක 12 - ආදායම් බදු**<br>අරමුදල විසින් 2020 දෙසැම්බර් 31 දිනට රුපියල් 934,018,739 ක් වූ විලම්භිත බදු වගකීම් හඳුනාගෙන නොතිබුණි. තවද, විලම්භිත බදු සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් අනාවරණය කර නොතිබුණි. | ජාතික රක්ෂණ භාර අරමුදල නිරීක්ෂණ සමග එකඟ වේ.<br>විලම්භිත බදු ගණනය කිරීම් සිදු කර ඉදිරි වාර්තාකරණයේදී පෙළිදරව් කරනු ඇත. | විලම්භිත බදුකරණය ගිණුම් තැබීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ.) සමානුපාතික සමූහ ප්‍රතිරක්ෂණ ගිවිසුම් (Proportional Treaty Re-Insurance Agreements) සඳහා වන අරමුදලේ ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව, ප්‍රතිරක්ෂණ නායකයාගේ තහවුරු කිරීම ( leader confirmation) සමග | ප්‍රතිරක්ෂණ වාරිකය හඳුනාගැනීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර ඇති අතර, එය ප්‍රතිපත්තියට අනුකූල වන අතර විමසුමේ සඳහන් කර ඇති පරිදි පටහැනි නොවේ. එය වාරික ලෙස හඳුනා ගත් වර්ෂයේදීම නායකත්ව තහවුරු කිරීමක් (leader confirmation) | කළමනාකාරිත්වය විසින් අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූලව ආදායම හඳුනාගත යුතුය. |

| | | |
|---|---|---|
| රක්ෂණ අවධානම පවරන්නා (cedants) වෙතින් ලැබෙන කාලච්ඡේද ප්‍රකාශන (periodic advice) පදනම් කර ගනිමින් ප්‍රතිරක්ෂණ වාරිකය හඳුනාගනු ලැබේ. කෙසේ වෙතත්, අදාළ ගිණුම් ප්‍රතිපත්තියට පටහැනිව 2020 ට පෙර අදාළ ප්‍රතිරක්ෂණ වාරිකය රුපියල් 628,756,431ක් සමාලෝචිත වර්ෂය සඳහා හඳුනාගෙන ඇත. තවදුරටත් සමාලෝචිත වර්ෂය සඳහා වූ ප්‍රතිරක්ෂණ වාරිකය රුපියල් 718,436,154 ක්, නායකත්ව තහවුරු කිරීම ( leader confirmation) සහ කාලච්ඡේද ප්‍රකාශන (periodic advice) ප්‍රමාද වී තිබීම හේතුවෙන් 2021 වසර සඳහා හඳුනාගෙන ඇත. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිරක්ෂණ ආදායම රු.89,679,723 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඔවුන්ට ලැබුණු බැවින් ප්‍රතිරක්ෂණ අංශය විසින් පිළිවෙළින් 2019 සහ 2020 වර්ෂයේදී රුපියල් 628,756,431 සහ රු. 718,436,154 ක පමණ ඉන්වොයිස් නිකුත් කර ඇත. එබැවින්, අනාවරණය කර ඇති ප්‍රතිපත්තියට අනුව, මෙය කිසිසේත්ම ප්‍රතිපත්තිය උල්ලංඝණය කිරීමක් නොවේ. | |
| (ආ.) සමානුපාතික නොවන සමූහ ප්‍රතිරක්ෂණ ගිවිසුම් (Non-Proportional Treaty Re-Insurance Agreement) සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව, වසර ආරම්භයේ දී ගිවිසුමේ දැනටමත් දක්වා ඇති ගිවිසුම් ගත දළ ලිඛිත වාරිකය (Gross Written Premium) මත පදනම්ව රක්ෂණ වාරිකය හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, ප්‍රතිරක්ෂණ වාරිකය හඳුනා ගැනීමේ අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තියට පටහැනිව, 2020ට පෙර අදාළ වන්නා වූ රු. 78,341,182 ක ප්‍රතිරක්ෂණ වාරික මුදල් සමාලෝචිත වර්ෂය සඳහා හඳුනාගෙන තිබුණි. තවදුරටත් සමාලෝචිත වර්ෂය සඳහා වූ ප්‍රතිරක්ෂණ වාරික මුදල් රු. 639,615 ක වටිනාකමක් 2021 වර්ෂයේදී හඳුනාගෙන තිබුණි. ගිණුම්කරණ කාලච්ඡේදය අවසානයේ දී පවතින අමතර තොරතුරු සහ වර්ධනයන් (developments) සමඟ එම ගිවිසුම් නැවත සමාලෝචනය කර අවශ්‍ය ගැළපීම් සිදු නොකිරීම හේතුවෙන් මෙම තත්වය ඇතිවී තිබේ. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා ආදායම රුපියල් 77,701,567 කින් අධිතක්සේරු වී ඇත. | ප්‍රතිරක්ෂණ වාරිකය හඳුනාගැනීමේ ප්‍රතිපත්තිය 'මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇති අතර එය ප්‍රතිපත්තියට අනුකූල වන අතර විමසුමේ සඳහන් කර ඇති පරිදි පටහැනි නොවේ. වාරික ලෙස පිළිගත් වර්ෂයේදීම නායකත්ව තහවුරු කිරීමක් (leader confirmation) ලැබුණු බැවින් ප්‍රතිරක්ෂණ අංශය විසින් 2019 සහ 2020 වසර තුළ ඉන්වොයිස් කරන ලද මුදල නිකුත් කර ඇත. එබැවින්, අනාවරණය කර ඇති ප්‍රතිපත්තියට අනුව, මෙය කිසිසේත්ම ප්‍රතිපත්තිය උල්ලංඝනය කිරීමක් නොවේ. | කළමනාකාරීත්වය විසින් අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූලව ආදායම හඳුනාගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ.) පීය ප්‍රතිරක්ෂණ ගිවිසුම් (Facultative Re-insurance Agreement) සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුව ප්‍රතිරක්ෂණ නායකයාගේ තහවුරු කිරීම (leader confirmation) ලැබීමෙන් පසු රක්ෂණ වාරිකය හඳුනාගෙන ඇත. එබැවින්, පූර්ව කාලපරිච්ඡේද සඳහා අදාළ රුපියල් 211,129,506 ක ප්‍රතිරක්ෂණ වාරික සමාලෝචිත වර්ෂයේදී හඳුනාගෙන ඇත. තවද, සමාලෝචිත වර්ෂය සඳහා අදාළ ප්‍රතිරක්ෂණ වාරික මුදල් රු. 50,279,153 ක් 2021 වර්ෂයේදී හඳුනාගෙන ඇත. එබැවින් වර්ෂය සඳහා ආදායම රුපියල් 160,850,353 කින් අධිතක්සේරු වී ඇත. | ප්‍රතිරක්ෂණ වාරිකය හඳුනාගැනීමේ ප්‍රතිපත්තිය 'මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇති අතර එය ප්‍රතිපත්තියට අනුකූල වන අතර විමසුමේ සඳහන් කර ඇති පරිදි පටහැනි නොවේ. වාරික ලෙස පිළිගත් වර්ෂයේ දිම නායකයාගේ තහවුරු කිරීමක් ලැබුණු බැවින් ප්‍රතිරක්ෂණ අංශය විසින් 2019 සහ 2020 වසර තුළ ඉන්වොයිස් කරන ලද මුදල නිකුත් කර ඇත. එබැවින්, අනාවරණය කර ඇති ප්‍රතිපත්තියට අනුව, මෙය කිසිසේත්ම ප්‍රතිපත්තිය උල්ලංඝනය කිරීමක් නොවේ. | කළමනාකාරීත්වය විසින් අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූලව ආදායම හඳුනාගත යුතුය |
| (ඈ.) මූල්‍ය ප්‍රකාශනය සහ පොදු ලෙජර් පාලන ගිණුමට අනුව අභ්‍යන්තර ප්‍රතිරක්ෂණ (Inward Reinsurance) වෙතින් ලැබිය යුතු වාරික වටිනාකම රු. 1,267,806,451කි. කෙසේ වෙතත්, ලැබිය යුතු ප්‍රතිරක්ෂණ වාරික වයස් විශ්ලේෂණයට අනුව ශේෂය රු. 1,258,772,697 කි. එබැවින් රු. 9,033,754 ක වෙනසක් නිරීක්ෂණය විය. | නිරීක්ෂණයට සමග එකඟ වේ. | කළමනාකාරීත්වය කාලෝචිත ලෙස වෙනස්කම් හඳුනාගෙන එම වෙනස්කම් නිවැරදි කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ඉ.) මූල්‍ය ප්‍රකාශනවල කාර්ය මණ්ඩල ආපදා ණය ශේෂය සහ ඒ සම්බන්ධව විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සවිස්තරාත්මක වාර්තාව අතර රුපියල් 3,537,190 ක වෙනසක් නිරීක්ෂණය වී ඇත. | අප නිරීක්ෂණයට සමග එකඟ වේ.මෙම වෙනස ප්‍රධාන වශයෙන් දිගුකාලීන ආරම්භක ශේෂ දෝෂ හේතුවෙන් සිදු වී ඇත. මෙම වෙනස්කම් ඉදිරි ක්‍රියාමාර්ග සඳහා අධ්‍යක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ. | කළමනාකාරීත්වය කාලෝචිත ලෙස වෙනස්කම් හඳුනාගෙන එම වෙනස්කම් නිවැරදි කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය |
| (ඊ.) භාණ්ඩාගාර බැඳුම්කරවල ධාරණ අගය 2020 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 139 කින් අධිතක්සේරු වී ඇත. සාධාරණ අගය ගණනය කිරීම සඳහා අරමුදල විසින් භාවිතා කරන ලද වෙළඳපල මිල ගණනය කිරීමේ දෝෂය හේතුවෙන් වෙනස සිදු වී ඇත. | වෙළඳපල වටිනාකමට පැමිණීමේදී මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද සාමාන්‍ය මිල භාවිතා කරමින් ජාතික රක්ෂණ භාර අරමුදල විසින් භාණ්ඩාගාර බැඳුම්කරවල සාධාරණ වටිනාකම ගණනය කර ඇත. කෙසේ වෙතත්, ආයෝජන පිළිබඳ උපදේශන සමාගමක් විසින් සිදු කරන ලද සවිස්තරාත්මක විගණනයට අනුව, වෙළඳපල මිල ගණනයේදී මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද විකුණුම් මිල භාවිතා කරන ලෙස ජාතික රක්ෂණ භාර අරමුදලට නිර්දේශ කරන ලදී. එබැවින්, ජාතික රක්ෂණ භාර අරමුදල විසින් සාධාරණ අගය තක්සේරු කිරීම සඳහා භාවිත කල අනුපාත වෙනස් කර ඇත. මෙම වෙනස ජාතික විගණන කාර්යාලය (NAO) | කළමනාකාරීත්වය විසින් භාවිතා කරන ලද තක්සේරු ක්‍රමය හෙළිදරව් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර එම තක්සේරු ක්‍රමය අඛණ්ඩව භාවිතා කළ යුතුය. |

| | | |
|---|---|---|
| | විසින් සාමාන්‍ය මිල යෙදීම නිසා සිදු වී ඇත. ප්‍රතිපත්තිය වෙනස් කිරීමට එකඟ විය | |
| (උ.) භාණ්ඩාගාර බිල්පත්වල ධාරණ අගය 2020 දෙසැම්බර් 31 දිනට රු මිලියන 1.08 කින් අධිතක්සේරු වී ඇත. සාධාරණ අගය ගණනය කිරීම සඳහා අරමුදල විසින් භාවිතා කරන ලද කූපන් අගය ගණනය කිරීමේ දෝෂය හේතුවෙන් මෙම වෙනස්කම් සිදුවී ඇත. | වෙළඳපල වටිනාකමට පැමිණීමේදී මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද සාමාන්‍ය මිල භාවිතා කරමින් ජාතික රක්ෂණ භාර අරමුදල විසින් භාණ්ඩාගාර බැඳුම්කරවල සාධාරණ වටිනාකම ගණනය කර ඇත. කෙසේ වෙතත්, ආයෝජන පිළිබඳ උපදේශන සමාගමක් විසින් සිදු කරන ලද සවිස්තරාත්මක විගණනයට අනුව, වෙළඳපල මිල ගණනයේදි මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද විකුණුම් මිල භාවිතා කරන ලෙස ජාතික රක්ෂණ භාර අරමුදලට නිර්දේශ කරන ලදී . එබැවින්,ජාතික රක්ෂණ භාර අරමුදල විසින් සාධාරණ අගය තක්සේරු කිරිම සඳහා භාවිත කල අනුපාත වෙනස් කර ඇත. මෙම වෙනස ජාතික විගණන කාර්යාලය (NAO) විසින් සාමාන්‍ය මිල යෙදීම නිසා සිදු වී ඇත. ප්‍රතිපත්තිය වෙනස් කිරීමට එකඟ විය. | කළමනාකාරිත්වය විසින් භාවිතා කරන ලද තක්සේරු ක්‍රමය හෙළිදරව් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර එම තක්සේරු ක්‍රමය අඛණ්ඩව භාවිතා කළ යුතුය. |
| (ඌ.) 2019 වර්ෂය සඳහා වූ රුපියල් 1,598,006 ක වියදම් 2020 වර්ෂය සඳහා ගිණුම්ගත කර ඇත. එබැවින් වර්ෂය සඳහා වූ වියදම් අධිතක්සේරු වී ඇති අතර එම ප්‍රමාණයෙන්ම වර්ෂය සඳහා වූ ලාභය අවතක්සේරු වී ඇත. | 2019 වර්ෂයට අදාළ මෙම උපචිත වියදම්, 2019 වසරේ වියදම් ලෙස සටහන් කර තිබිය යුතු වුවත් 2020 වසර සඳහා සාවද්‍ය ලෙස සටහන් කර ඇත. කෙසේ වෙතත්, LKAS 08 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ දෝෂ ප්‍රමිතියෙහි 06 වන ඡේදය අනුව, මෙම සාවද්‍ය ප්‍රකාශයෙහි බලපෑම් පරිශීලකයන්ගේ ආර්ථික තීරණ ගැනීම කෙරෙහි බලපෑමක් නොවන බැවින් (ප්‍රමාණාත්මක නොවන), මෙම දෝෂය 2019 දී නැවත සකස් කිරිම (restated) අවශ්‍ය නොවේ. | උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා සුදුසු ක්‍රියාවලීන් ඇති බවට කළමනාකාරිත්වය සහතික විය යුතුය. |
| (එ.) 2017/2018 වසර සඳහා ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමයේ (NNDIS) ගැළපුම් වාරිකය (adjustment premium) හේතුවෙන් ප්‍රතිරක්ෂණ ගිවිසුම්වලින් පැන නැගුණු ප්‍රතිරක්ෂණ වගකීම් රු. 123,387,679 ක වටිනාකමක් සහ 2018/2019 වර්ෂය සඳහා අරමුදල විසින් තම අවධානම ප්‍රතිරක්ෂණය කිරීමෙන් පැන නැගුණු ප්‍රතිරක්ෂණයෙහි ගැළපුම් වාරිකය (Adjustment premium of Retrocession Re-insurance) රු. 466,292,684ක වටිනාකමක් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන නොතිබුණි | 2018/19 වසර සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ජාතික ස්වභාවික ආපදා රක්ෂණ යෝජනා ක්‍රමය (NNDIS) හි දීර්ඝ කරන කාලසීමාව සඳහා අවම තැන්පතු වාරිකය රු. 401,153,424/- ක් (Minimum deposit premium) 2019 දී හඳුනාගනු ලැබිණි. කෙසේ වෙතත්, 2018/2019 සඳහා තම අවධානම ප්‍රතිරක්ෂණය කිරීමෙන් පැන නැගුණු ප්‍රතිරක්ෂණයෙහි ගැළපුම් වාරිකය (retrocession) සහ NNDIS ගැළපුම් වාරිකය වූ රු.589,680,363/- අගය අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර නොමැති අතර වගකීම භාර ගැනීම සැක සහිත බැවින් 2021 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොමැත. පසුව, | කළමනාකාරිත්වය විසින් එක් එක් එක් වාර්තාකරණ කාල සීමාව අවසානයේ පවතින ගිවිසුම් සමාලෝචනය කළ යුතු අතර එම ගිවිසුම්වල විධිවිධානවලින් පැන නගින වගකීම් හඳුනාගෙන ඒ අනුව ගිණුම්ගත කළ යුතුය. |

2021 දෙසැම්බර් මාසයේදී නීතිපතිවරයාගේ මතය ලැබීමෙන් පසු, ජාතික රක්ෂණ භාර අරමුදලේ වගකීම රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ  එකඟතාවයට සහ අනුමැතියට සහ විශේෂ කැබිනට් අනුමැතියට යටත් විය හැකිය. කෙසේ වෙතත්, සමාලෝචිත කාල සීමාව සඳහා මූල්‍ය ප්‍රතිඵලවලට කිසිදු බලපෑමක් නොමැත.

### 1.5.4 නුසුදුසු තක්සේරු කිරීම හෝ ඇස්තමේන්තු කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ.) ශේෂ පත්‍ර දිනට පවතින ගංවතුර නොවන හිමිකම් පෑම් සඳහා වන දිගුකාලීන හිඟ ප්‍රතිපාදන පිළිබඳව අරමුදල නිසි ඇගයීමක් සිදු කර නොතිබූ බැවින් ප්‍රතිපාදනවල නිරවද්‍යතාවය තහවුරු කර ගත නොහැක.ගංවතුර නොවන හිමිකම් පෑම් සඳහා වූ රුපියල් 427,550,703 ප්‍රතිපාදන වසර දෙකේ සිට පහකට වැඩි කාලයක් හිඟව තිබූ අතර රුපියල් 156,589,534 ක ප්‍රතිපාදන වසර පහකට වැඩි කාලයක් හිඟව තිබිණි | කෙසේ වෙතත්,අදාළ රක්ෂණ සමාගම් විසින් තහවුරු කිරීම් ලබා ගැනීමෙන් පසුව, ගංවතුර නොවන හිමිකම් සඳහා වූ ප්‍රතිපාදනවලින් සැලකිය යුතු දිගුකාලීන හිඟ ශේෂයක් ඉවත් කරන ලදී. | කළමනාකාරිත්වය විසින් දිගුකාලීන හිඟ ශේෂයන් ඇගයීමට ලක් කළ යුතු අතර එම ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ.) අංක 1791/4 දරන සහ 2012 දෙසැම්බර් 21 දිනැති ගැසට් පත්‍රයට අනුව, සාමාන්‍ය (ජීවිත නොවන) ප්‍රතිරක්ෂණය සඳහා අනිවාර්ය ප්‍රතිශතය (mandatory cession) සියයට 30 කි. කෙසේ වෙතත්, අරමුදල අලාභ සඳහා සියයට 100 ක ප්‍රතිශතයක ප්‍රතිපාදන සලසා ඇත. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිරක්ෂණ ප්‍රතිපාදනය රු. 7,210,000 කින් අධිතක්සේරු වී ඇත. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. කෙසේ වෙතත්, එම දෝෂ පසුව නිවැරදි කරන ලදී. | කළමනාකාරිත්වය විසින් ප්‍රතිපාදනවල යෝග්‍යතාවය නිසි ලෙස සමාලෝචනය කළ යුතුය |
| (ඇ.) 2016 ඔක්තොම්බර් 05 වන දින වන විටත් ප්‍රතිරක්ෂණය මගින් ගෙවීම සඳහා වගකීමක් නොමැති බව රක්ෂණකරු දන්වා ඇතත්, රුපියල් 801,513 ක් ගෙවිය යුතු ප්‍රතිරක්ෂණය ලෙස තවමත්  මූල්‍ය ප්‍රකාශනවල පවතී. | නිරීක්ෂණය සමඟ එකඟ විය. මෙම හිමිකම් පෑම 2021 මුදල් වර්ෂය තුළ ඉවත් කරන ලදී. | කළමනාකාරිත්වය විසින් එක් එක් වාර්තාකරණ කාල සීමාව අවසානයේ ප්‍රතිරක්ෂණ වගකීම් තක්සේරු කර ඒ අනුව ගැළපීම් කළ යුතුය. |
| (ඈ.) 2020 වසර අවසානයේ රුපියල් 510,530,810 ක් වූ ගෙවිය යුතු අග්‍රහාර හිමිකම් සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සාධාරණ බව සනාථ කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය, ජීවගණකගේ තක්සේරුව හෝ වෙනත් ලියකියවිලි වැනි කිසිදු සාක්ෂියක් සපයා නොතිබුණි. | අග්‍රහාර සඳහා හිමිකම් ප්‍රතිපාදන ඇස්තමේන්තුව අග්‍රහාර හිමිකම් ප්‍රධානියාගෙන් ලබා ගන්නා ලදී. එබැවින්, 2020 වසර අවසානයේ දී කරන ලද ප්‍රතිපාදන පදනම් වී ඇත්තේ හිමිකම් දෙපාර්තමේන්තු පළපුරුද්ද සහ විනිශ්චය මත ය. මෙය කොවිඩ් 19 බලපෑම හේතුවෙන් කාලාන්තරයක් පුරා ගොඩනැගුණු හිමිකම් ප්‍රමාණය | කළමනාකාරිත්වය විසින් එක් එක් වාර්තාකරණ කාලපරිච්ඡේදය තුළ සිදුකරනු ලබන ප්‍රතිපාදන වල සාධාරණත්වය තක්සේරු කර, ඒ අනුව ගිණුම්ගත කර විගණනය සඳහා තොරතුරු සැපයිය යුතුය. |

| | | |
|---|---|---|
| | සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල කරන ලද අතිරේක ප්‍රතිපාදනයකි. මෙම හිමිකම් ප්‍රතිපාදන වාර්තා කරන ලද හිමිකම් සම්බන්ධයෙන් වන අතර එබැවින් ජීවගණක තක්සේරු කිරීම් අවශ්‍ය නොවන බව කරුණාවෙන් සලකන්න. තත්‍ය ලෙසම, ජීවගණක විසින් IBNR තක්සේරු කිරීමේදී මෙම ප්‍රතිපාදන අගය සලකා බලා ඇත. එක් එක් අංශවල ප්‍රතිපාදන අගයන් අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම ප්‍රායෝගික නොවන අතර, ඒ වෙනුවට 2020 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අනුමත වූ විට අග්‍රහාර හිමිකම් ප්‍රතිපාදන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සාකච්ඡා කර එකඟතාවකට පැමිණ ඇත. | |
| (ඉ.) 2020 වර්ෂය සඳහාවන මෝටර් රථ රක්ෂණ හිමිකම් සඳහා ගෙවිය යුතු ශේෂය රුපියල් 10,323,235 ක් ලෙස දැක්වෙන අතර එම වටිනාකම කිසිදු තක්සේරුවකින් තොරව 2019 වසරේ සිට අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇත. | මෙම SRCC දිගුකාලීන හිඟ හිමිකම් පෙර වසරවලදී දැනුම් දී ඇති අතර අදාළ කමිටු මගින් අනුමත කර ඇත. කෙසේ වෙතත්, පියවීම් සඳහා ලියකියවිලි ලැබෙන තෙක් , මෙම ශේෂයන් දිගු හිඟ ශේෂයන් වේ. නිරවුල් කිරීම සහ අවශ්‍ය අනුමැතිය සඳහා අවශ්‍යතාවය තහවුරු කිරීමෙන් අනතුරුව ප්‍රතිපාදනය ආපසු හැරවීමට කටයුතු කරනු ලැබේ. | කළමනාකාරීත්වය විසින් එක් එක් වාර්තාකරණ කාල සීමාව තුළ වගකීම්වල සාධාරණත්වය තක්සේරු කර ඒ අනුව ගිණුම්ගත කළ යුතුය. |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ.) ලැබිය යුතු කාර්ය මණ්ඩල ණය | 54,274,121 | ණය ලේඛනය | කාර්ය මණ්ඩල ණය ලේඛනය 2022 ජුනි 30 වන දින වන විටත් විද්‍යුත් තැපෑලෙන් යවා ඇත | ඵලදායි විගණන ක්‍රියාකාරීත්වය සඳහා කළමනාකාරීත්වය විසින් තොරතුරු නියමිත වේලාවට ලබා දීම සහතික කළ යුතුය. |
| (ආ.) ලැබිය යුතු ආදායම් බදු | 22,465,243 | බදු ගණනය කිරීම සහ තහවුරු කිරීම් | අප මුළු ආදායම් බදු ගණනය ලබා දී ඇති අතර එය රු. 1,220,442,752 කි. එම නිසා රු. 22,465,243 අවතක්සේරු කිරීමක් ලෙස ප්‍රකාශ කළ නොහැක. කෙසේ වෙතත්, අන්තර් දෙපාර්තමේන්තු සැලකූ විට, ආදායම් බදු වගකීම් ඇත්තේ SRCC අංශයට පමණක් වන අතර | |

| | | | |
|---|---|---|---|
| | | | අනෙක් අංශයන්ට බදු අලාභයන් ඉදිරියට ගෙන යනු ලැබේ. |
| (ඇ.) කෘෂිකාර්මික රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා ප්‍රතිරක්ෂණ වාරිකය | 148,380,847 | කුවිතාන්සි සහ ගෙවීම් විස්තර | මුදල් අමාත්‍යාංශයේ ඉල්ලීමකට පිළිතුරු දීම සඳහා අදාළ ගොනුව දැනට වැඩ තහනමට ලක්ව සිටින හිටපු ප්‍රධාන විධායක නිළධාරිවරයාට භාරදීම හේතුවෙන් මෙම ලිපිගොනුව ලබා ගැනීමට නොහැකි වී තිබේ. ප්‍රධාන විධායක නිළධාරියාට එරෙහිව වැඩ තහනම් ලිපිය 16/12/2019 දින නිකුත් කර ඇති අතර ඔහුට ජාතික රක්ෂණ භාර අරමුදල පරිශ්‍රයට ඇතුළුවීම සීමා කර ඇත.<br>එබැවින් ඔහු භාරයේ ඇති ලිපිගොනු වෙත ජාතික රක්ෂණ භාර අරමුදල කළමනාකාරිත්වයට ප්‍රවේශයක් නොමැත. මුලාරම්භය අතුරුදහන් වුවද, ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ඉල්ලා සිටින සාක්ෂි මෙන්ම වෙනත් ඕනෑම තොරතුරක් අවශ්‍ය විටදී සැපයීමට හැකියාව ඇති බව කරුණාවෙන් සලකන්න. |

## 1.6 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලැබිය යුතු මුළු ප්‍රතිරක්ෂණ වාරික මුදලින් 11.3% නියෝජනය කරනු ලබන වසරක් (01) තුළ හිඟ ලැබිය යුතු ප්‍රතිරක්ෂණ වාරිකය රු. 142,595,979 ක් වූ අතර මුළු ලැබිය යුතු ශේෂයෙන් 11.8% ක් නියෝජනය කරනු ලබන වසර දෙකක් (02) තුළ හිඟ ශේෂය රු. 148,466,031 කි. මුළු හිඟ ශේෂයෙන් 12% නියෝජනය කරන වසර තුනක් (03) තුළ හිඟ | 31/12/2021 දිනට හිඟ ශේෂයේ වයස් විශ්ලේශන තත්ත්වයන් පහත පරිදි වේ. එබැවින්, වසර 3 ට වැඩි ශේෂයන් 89% ක් නියෝජනය කරනු ලබන මිලියන 16 ක් අයකරගෙන ඇත. | හිඟ ශේෂයන් අයකර ගැනීමට කළමනාකාරීත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

ශේෂය රු. 151,033,057 කි. දිගුකාලීනව පැවති ලැබිය යුතු ප්‍රතිරක්ෂණ මුදල් අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ.) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනතේ 7, 31(2) සහ 49(ආ). | සකස් කරන ලද රීති ලෙස තොරතුරු ඇතුළත් කාර්තුමය ප්‍රතිලාභ හැට එකක් (61) රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, COVID 19 වසංගතය හේතුවෙන් රක්ෂණ නියාමන කොමිෂන් සභාව විසින් ලබා දී ඇති දීර්ඝ කිරීම් සලකා බැලීමෙන් පසු දින 38 සිට 285 දක්වා ප්‍රමාදයකින් පසු තෛමාසික වාර්තා 16 ක් ඉදිරිපත් කර තිබුණි. | වසරක් සඳහා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය වන්නේ කාර්තුමය ප්‍රතිලාභ 04ක් පමණක් බව කරුණාවෙන් සලකන්න. මෙම සියලු ප්‍රමාදයන් සිදුවූයේ සංචරණ සීමා කිරීම්, ප්‍රාදේශීය අගුලු දැමීම්, කාර්ය මණ්ඩල කෝවිඩ් පරීක්ෂා වාර්තා ධන වීම වැනි කෝවිඩ් 19 වසංගත බලපෑම් නිසා ය. පවතින ගිණුම්කරණ පද්ධති අන්තර්ජාලය මත පදනම් නොවන බැවින් ගිණුම් සැකසීම සඳහා සේවයට වාර්තා කිරීම අත්‍යවශ්‍යය. කෙසේ වෙතත්, මෙම ප්‍රමාදයන් සඳහා හේතු සහ ඉදිරිපත් කළ හැකි දිනයන් සමඟින් මෙම ප්‍රමාදයන් පිළිබඳව රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත වරින් වර දැනුම් දෙන ලදී.<br>මෙම ප්‍රමාදයන් මඟහරවා ගැනීමට දැනටමත් පියවර ගෙන ඇත. | ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ ඉදිරිපත් කිරීමේදී අනාගතයේදී සිදුවන ප්‍රමාදයන් වළක්වා ගැනීමට කළමනාකාරීත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ.) 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 13(ඉ) වගන්තිය | පනතේ විධිවිධානවලට අනුව අරමුදල සම්බන්ධයෙන් සාමාන්‍ය ගිණුමක් සහ එක් එක් සාමාජිකයා සම්බන්ධයෙන් වෙන වෙනම තනි ගිණුම් පවත්වාගෙන යා යුතුය. කෙසේ වෙතත්, අරමුදල විසින් තනි සාමාජිකයින් සඳහා වෙනම ගිණුම් පවත්වාගෙන ගොස් නොතිබුණි. | තනි පුද්ගල ගිණුම් විස්තර තොරතුරු පද්ධතිය තුළ පවත්වාගෙන යනු ලැබේ; සේවාලාභීන්ගේ ජාතික හැඳුනුම් පත් භාවිතයෙන් ඒවාට ප්‍රවේශ විය හැක. | පනතේ අදාළ විධිවිධානවලට අරමුදල අනුකූල විය යුතුය. |
| (ඇ.) 2006 අංක 28, ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 23 වැනි ඡේදය | පනතේ විධිවිධානවලට අනුව, රක්ෂණ සමාගම් විසින් අරමුදලට උපචිත මුදල නිවැරදිව ඉන්වොයිස් කර ප්‍රේෂණය කර තිබේද යන්න තහවුරු කර ගැනීම සඳහා රක්ෂණ සමාගම්වල වාර්තා | සාමාන්‍යයෙන්, අභ්‍යන්තර විගණන අංශය රක්ෂණ සමාගම්වල ආදායම් සත්‍යාපනය සිදු කරයි. කෙසේ වෙතත්, Covid වසංගතය හේතුවෙන්, මෙම සත්‍යාපනය ක්‍රියාත්මක නොවීය. | පනතේ අදාළ විධිවිධානවලට අරමුදල අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පරීක්ෂා කිරීමට අරමුදල අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | | |
| (ඈ.) මු.රෙ. 261(1) | ගෙවීම් වවුචරවල අනුක්‍රමික අනුපිළිවෙල නිසි ලෙස නඩත්තු කර නොතිබුණි. | අපි නිරීක්ෂණය සටහන් කළෙමු. මූල්‍ය ප්‍රකාශන සඳහා අවසාන දිනය පෙබරවාරි 28 වන දින බැවින්, අප උපචිත වියදම් සඳහා අදාළ කර ගත් ගනුදෙනු 2020 ජනවාරි 15 වැනි දිනට පමණක් සලකා බලන ලදී. සියලුම අමුණා ඇති වියදම් 2022 ජනවාරි අවසානයේ සිදු කරන ලදී. | ගෙවීම් වවුචරවල අනුක්‍රමික අනුපිළිවෙල පවත්වාගෙන යාමට කළමනාකාරිත්වය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ.) මු.රෙ. 386(7) | අවලංගු කරන ලද චෙක්පත්, චෙක් පිළිපතට අමුණා චෙක් පොතේ තබා ගත යුතු වුවද, අරමුදල විසින් ගෙවීම් වවුචරය සමඟ චෙක් පිළිපතට අමුණා ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වවුචරය අස්ථානගත වීමකදී අවලංගු කරන ලද චෙක්පත් සම්බන්ධ සියලු තොරතුරු නැතිවී යා හැක. | ජාතික රක්ෂණ භාර අරමුදල චෙක් මුද්‍රණ කටයුතු සඳහා අඛණ්ඩ චෙක්පත් රෝල් භාවිතා කරන බැවින් චෙක් පිළිපත් වෙන වෙනම ගොනු කිරීම ප්‍රායෝගිකව කළ නොහැක.එබැවින්, ගෙවීම් වවුචරය සමඟ චෙක් පිළිපත අමුණා ගොනු කර ඇත. වවුචරයේ යම් අස්ථානගත වීමක් සිදුවුවහොත්, ACCPAC පද්ධතිය තුළ සියලුම විස්තර ලබා ගත හැකි අතර පද්ධතිය තුළ පළ කිරීමෙන් පසු වවුචර විස්තර වෙනස් කළ නොහැක. කෙසේ වෙතත් අවලංගු කරන ලද චෙක්පත් චෙක් පිළිපත් සමග අමුණා ඇත. | කළමනාකරණය මුදල් රෙගුලාසිවල අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. |
| (ඊ.) මු.රෙ. 395 (ආ) | බැංකු සැසඳීම ප්‍රකාශ අදාළ ගෙවන නිලධාරියා විසින් සහතික කළ යුතු අතර, ඒවා පරීක්ෂා කිරීම සඳහා විගණනයට ලබා දිය යුතුය. කෙසේ වෙතත්, බැංකු ගිණුම් එකොළහක් (11) සඳහා සකස් කරන ලද බැංකු සැසැඳීම ප්‍රකාශනයන් නම, තනතුර සහ දිනය නොමැතිව සහතික කර තිබුණි. | බැංකු සැසැඳීම තුළ සකස් කිරීම, පරීක්ෂා කිරීම, සහතික කිරීම සහ අනුමත කිරීම සඳහා ලබා දී ඇති වත්මන් අත්සන් කිරීමේ ඉඩ සඳහා නම, තනතුර සහ දිනය සහිතව වගකිවයුතු නිලධාරියා ඇතුළත් වන පරිදි බැංකු සැසැඳීම ප්‍රකාශ සංශෝධනය කරනු ලැබේ. | කළමනාකරණය මුදල් රෙගුලාසිවල අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. |
| (උ.) මු.රෙ 396 | මුදල් රෙගුලාසිවල දක්වා ඇති, චෙක්පත නිකුත් කළ දින සිට මාස හයකට වැඩි කාලයක් මුදල් කර නොගත් චෙක්පත් සඳහා අනුගමනය කල යුතු ක්‍රියා පටිපාටිය අනුගමනය කර නොතිබුණි. 2021 ජනවාරි 31 දිනට බැංකු ගිණුම් දෙකක (02) රු. | මෙම ඉදිරිපත් නොකළ චෙක්පත් අග්‍රහාර සහ මෝටර් හිමිකම් ගෙවීම් හා සම්බන්ධ වේ. ජාතික රක්ෂණ භාර අරමුදල දැනට ලියාපදිංචි තැපැලෙන් පාරිභෝගිකයින්ට සිහිකැඳවීම් යවනු ලැබේ. ඔවුන්ගේ ප්‍රතිචාරය මත පදනම්ව, අප විසින් ඉදිරිපත් නොකළ ප්‍රමාණයන් ආදායමට ගැනීම හෝ වලංගු | කළමනාකරණය මුදල් රෙගුලාසිවල අවශ්‍යතාවලට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 3,501,599 ක් පමණ වන අවලංගු වූ චෙක්පත් හැට එකක් (61) නිරීක්ෂණය වී ඇත. | කාලය දීර්ඝ කරනු ලැබේ. | |
| (ඉ.) 2015 මැයි 25 දිනැති අංක PED 2/2015 දරන රාජය ව්‍යාපාර චක්‍රලේඛයේ 04 වගන්තිය | චක්‍රලේඛයේ විධිවිධාන අනුව ජංගම දුරකථන මිලදී ගැනීමේ පිරිවැය නිළධාරීන් විසින් පුද්ගලිකව උපයා ගත යුතුය. කෙසේ වෙතත්, අරමුදල විසින් 2016 සිට 2020 දක්වා රු. 2,432,371 ක ජංගම දුරකථන සේවකයින් සඳහා මිලදී ගෙන ඇත. | ව්‍යාපාරික අවශ්‍යතා සපුරාලීම සඳහා ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ජංගම දුරකථන මිල දී ගෙන එ්වා වත්කම් ලෙස සටහන් කර (ඉන්වෙන්ටරිය වෙත ගෙන ගොස්) කාර්ය මණ්ඩලයට භාවිතය සඳහා වෙන් කර ඇති අතර රැකියාවෙන් ඉල්ලා අස් වූ විට හෝ වෙන් කළ කාල සීමාව අවසානයේ දී ජංගම දුරකථනය ආපසු ජාතික රක්ෂණ භාර අරමුදල වෙත ලබා දිය යුතුය. එබැවින් මෙය චක්‍රලේඛයේ දක්වා ඇති පුද්ගලික ජංගම දුරකථන ප්‍රතිපූරණයක් නොවේ. | කළමනාකාරීත්වය චක්‍රලේඛයේ අවශ්‍යතාවලට අනුකූල විය යුතුය |

## 1.8 ආයෝජන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ.) ආයෝජන ප්‍රතිපත්තියේ 13 වැනි ඡේදයේ ආයෝජන කළමනාකරුගේ භූමිකාව අර්ථ දක්වා ඇතත්, 2020 අගෝස්තු 30 සිට මෙම තනතුර පුරප්පාඩුව පවතී. | ආයෝජන කළමනාකරුවෙකු සේවයේ යෙදවීමේ වැදගත්කම අපි හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, 2019.11.20 දින නිකුත් කරන ලද මුදල් අමාත්‍යංශයේ චක්‍රලේඛයට අනුව බඳවා ගැනීම් තාවකාලිකව නවතා ඇති බැවින් ආයෝජන කළමනාකරුගේ පුරප්පාඩුව පිරවිය නොහැක. | අරමුදල් ආයෝජනය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම කළමනාකාරීත්වය විසින් සහතික කළ යුතුය. |
| (ආ) ආයෝජන ප්‍රතිපත්තියේ 17 වැනි ඡේදයට අනුව ආයෝජන කමිටුව වරින් වර රැස්විය යුතු අතර ආයෝජන කමිටුවේ වගකීම් නිර්වචනය කර තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා ආයෝජන කමිටුව රැස්වී නොතිබුණි | ආයෝජන කළමනාකරු තනතුරේ පුරප්පාඩුව සහ 2020 වර්ෂයේ දී කොවිඩ් වසංගතය හේතුවෙන් ආයෝජන කමිටුව රැස් වී නොතිබුණි. කෙසේ වෙතත්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව රජය සතු ව්‍යාපාර සඳහා නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතට අනුව පසුගිය වසර දෙක තුළ වසරකට අවම වශයෙන් රු. බිලියන 30 ක ස්ථාවර ආදායමක් සහිත රජය සතු ව්‍යාපාර, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපිත කරන ලද ආයෝජන ප්‍රතිපත්තියට අනුකූලව ආයෝජන කමිටුවක් (IC) පිහිටුවිය යුතුය. කෙසේ වෙතත්, ජාතික රක්ෂණ භාර අරමුදල එම අවශ්‍යතාවයට යටත් නොවේ. | ආයෝජන කමිටුවේ ඵලදායී ක්‍රියාකාරීත්වය සඳහා කළමනාකාරීත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ.) ආයෝජන ප්‍රතිපත්තිය නිතිපතා සමාලෝචනය කිරීමට ආයෝජන ප්‍රතිපත්තියේ ප්‍රතිපාදන නොමැත. තවද, ආයෝජන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙන් පසු අධ්‍යක්ෂක මණ්ඩලය විසින් එය සමාලෝචනයට ලක් කර නොතිබූ අතර නියමිත වේලාවට ප්‍රතිපත්තියට අවශ්‍ය වැඩිදියුණු කිරීම් ඇතුළත් කර නොමැත. | ආයෝජන කමිටුව සංස්ථාගත කිරීමෙන් පසු ආයෝජන ප්‍රතිපත්ති සමාලෝචනය ඉදිරියේදී සිදු කෙරේ. | ආයෝජන ප්‍රතිපත්තිය නිරන්තරයෙන් සමාලෝචනය කිරීමට කළමනාකාරිත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ.) ආයෝජන ප්‍රතිපත්තියට අනුව, ආයෝජන තෝරා ගැනීම ආර්ථික තත්ත්වයන්, පොලී අනුපාත හැසිරීම්, අනාගත ප්‍රවණතා සහ අරමුදලේ මෙහෙයුම් මුදල් ප්‍රවාහ අවශ්‍යතා ඇගයීම මත පදනම් වේ. කෙසේ වෙතත්, දූරදර්ශී ලෙස ආයෝජන තීරණ ගැනීම සඳහා අතිරික්ත මුදල් ප්‍රවාහයන් සහ එම මුදල් ප්‍රවාහයන් හඳුනා ගැනීම සඳහා මුදල් ප්‍රවාහ පුරෝකථනයන් සකස් කර නොතිබුණි. | මුදල් ප්‍රවාහයන් නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා සකස් කර නොමැත. ජාතික රක්ෂණ භාර අරමුදල ව්‍යාපාරයේ ස්වභාවය මත පදනම්ව , කුලිය (tenner) සහ මුදල පිළිබඳව ආයෝජන තීරණයක් ගැනීමට පෙර ද්‍රවශීලතා අවශ්‍යතාවය සහ අරමුදල් ලබා ගැනීමේ හැකියාව දිනපතා නිරීක්ෂණය කරනු ලැබේ. එබැවින්, මුදල් ප්‍රවාහ පුරෝකථනයන් මත නොව සැබෑ සංඛ්‍යා මත පදනම්ව තීරණ ගනු ලැබේ. දෛනික ශේෂයන් සහ ආයෝජන වාර්තාව මත පදනම්ව දෛනිකව පවතින අරමුදල් ප්‍රමාණය සහ අතිරික්ත අරමුදල් හඳුනා ගැනේ. | අනාගත මුදල් ප්‍රවාහයන් හඳුනා ගැනීම සඳහා මුදල් ප්‍රවාහ පුරෝකථනය සකස් කිරීමට සහ ආයෝජන තීරණ දූරදර්ශී ලෙස ගත යුතු කාලය හඳුනා ගැනීමට කළමනාකරණය කටයුතු කළ යුතුය. |
| ඉ.) අරමුදලේ මූල්‍ය වත්කම් (ආයෝජන) රු. 21,666,072,511 ක් වන අතර එය අරමුදලේ මුළු වත්කම්වලින් 79% ක් නියෝජනය කරයි. කෙසේ වෙතත්, ආයෝජන තීරණ සඳහා මූල්‍ය අධිකාරිය පැවරීම ආයෝජන ප්‍රතිපත්තියේ ආයෝජනවල වටිනාකම සහ ආයෝජන ප්‍රභවයන් මත අර්ථ දක්වා නොතිබුණි. ආයෝජනයේ වටිනාකම සහ ප්‍රභවයන් නොසලකා සියලුම ආයෝජන ආයෝජන කමිටුව විසින් පමණක් අනුමත කරන ලදී. | මූල්‍ය අධිකාරිය පැවරීම යටතේ, දෛනික ආයෝජන තීරණ ගත යුතු බැවින් අධ්‍යක්ෂක මණ්ඩලය විසින් එහි අධිකාරිය අදාළ නිළධාරීන්ට සහ ආයෝජන කමිටුවට පවරා තිබුණි. | ආයෝජන ක්‍රියාකාරකම්වල ඵලදායි ක්‍රියාකාරීත්වය සඳහා ආයෝජනයේ වටිනාකම සහ ආයෝජන ප්‍රභවයන් මත පදනම්ව කළමනාකාරිත්වය විසින් මූල්‍ය අධිකාරිය පැවරිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 7,526,099,442 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු 3,114,086,727 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 4,412,012,715 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පෙර වසර හා සසඳන විට ශුද්ධ ඉපැයූ වාරිකය රු. 1,027,001,050 කින් වැඩි වීම, ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම් වියදම් රු. 4,124,801,551 කින් අඩුවීම සහ ප්‍රාරක්ෂණ සහ අත්පත් කර ගැනීමේ (underwriting and acquisition) පිරිවැය රු. 440,830,904 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| වර්ෂය | 2020 | 2019 | විචලනය රු. | විචලනය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| ශුද්ධ ඉපැයූ වාරිකය | 17,475,027,816 | 16,448,026,766 | 1,027,001,050 | 6% |
| වෙනත් ආදායම් | 1,387,023,110 | 1,269,216,686 | 117,806,424 | 9% |
| ශුද්ධ ප්‍රතිලාභ සහ හිමිකම් | (7,954,516,263) | (12,079,317,814) | (4,124,801,551) | -34% |
| ප්‍රාරක්ෂණ (Underwritting) සහ අත්පත් කර ගැනීමේ පිරිවැය | (1,614,860,946) | (2,055,691,850) | 440,830,904 | -21% |
| වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම් | (409,175,576) | (552,685,117) | 143,509,541 | -26% |
| ආදායම් බදු | (1,339,826,929) | 105,600,661 | -1,445,427,590 | -1,369% |
| වසර සඳහා ලාභය | 7,526,099,442 | 3,114,086,727 | 4,412,012,715 | 142% |

## 2.3 අනුපාත විශ්ලේෂණය

විගණනයට ලබා දී ඇති මූල්‍ය ප්‍රකාශන සහ තොරතුරු අනුව, පසුගිය වසර තුන සඳහා වැදගත් අනුපාත කිහිපයක් පහත පරිදි විය.

| අනුපාතය | 2020 | 2019 | 2018 |
|---|---|---|---|
| රඳවා ගැනීමේ අනුපාතය | 161% | 143% | 138% |
| මුළු හිමිකම් අනුපාතය | 46% | 60% | 72% |
| වියදම් අනුපාතය | 12% | 16% | 16% |
| ඒකාබද්ධ අනුපාතය | 57% | 76% | 87% |
| ආදායම් වර්ධන අනුපාතය | 6% | 18% | 18% |
| ලාභදායිත්ව අනුපාතය | 90% | 24% | 34% |
| ශුද්ධ ලාභය | 40% | 18% | 21% |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය | 37% | 17% | 19% |
| හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය | 83% | 43% | 47% |
| ද්‍රවශීලතා අනුපාතය | 1.2 | 0.68 | 0.74 |
| ජංගම අනුපාතය | 6.26 | 8.92 | 9.34 |
| මුළු වත්කම්වලට මූල්‍ය වත්කම් අනුපාතය | 82% | 77% | 76% |
| වත්කම් පිරිවැටුම් අනුපාතය | 1.34 | 2.46 | 2.17 |

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ.) අරමුදලේ දත්තයන්හි විශ්වාසනීය මට්ටම ඉහළ නැංවීම සඳහා අවශ්‍ය වැඩිදියුණු කිරීම් සිදු කිරීමට අදාළව, දත්ත ග්‍රහණය කර ගැනීම, ව්‍යාපාරයේ ප්‍රධාන කොටස් බෙදීම, හිමිකම් ගණන් සැපයීම සහ හිමිකම් හැසිරවීමේ වියදම් | දැනට, OS අගයන් තබා ගැනීම විගණනය කරන ලද අංකවලට අනුකූල වේ. තවද, 2021 වර්ෂයේ සිට, ජාතික රක්ෂණ භාර අරමුදල සමාගමේ නිශ්චිත වක්‍ර හිමිකම් පිරිවැය ඇස්තමේන්තු කිරීම සඳහා එහි හිමිකම් | අරමුදලේ දත්ත වල විශ්වාසනීය මට්ටම වැඩි දියුණු කිරීම සඳහා ජීව ගණක විසින් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කළමනාකාරීත්වය අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| සම්බන්ධයෙන් ජීව ගණක විසින් කරන ලද නිර්දේශ, අධ්‍යක්ෂක මණ්ඩල මට්ටමින් හෝ සුදුසු කළමනාකරණ මට්ටමින් සාකච්ඡා කර නොතිබුණි. | හැසිරවීමේ වියදම් සැපයීම සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලේ අත්දැකීම් අනුගමනය කරන අතර කර්මාන්ත අත්දැකීම් තවදුරටත් භාවිතා නොකරයි. ජාතික රක්ෂණ භාර අරමුදල හි ව්‍යාපාරවල ස්වභාවය මත, උදාහරණයක් ලෙස, ප්‍රතිරක්ෂණය සහ SRCC ආදි කාරණා හේතුවෙන් අනෙකුත් බොහෝ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම අපහසු වේ. කෙසේ වෙතත්, අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන අවස්ථාවේදී වාර්තා කර නොමැති හිමිකම් වගකීම (IBNR) ප්‍රතිඵල සාකච්ඡා කර ඇත. | |
| (ආ.) අවශ්‍ය ජීව ගණක තොරතුරු රැස් කිරීම, රඳවා තබා ගැනීම සහ සැපයීම සඳහා අරමුදල විසින් ජීව ගණක අංශයක් ස්ථාපිත කර නොමැත. | ජාතික රක්ෂණ භාර අරමුදල හි ජීව ගණක අංශයක් ස්ථාපිත කර නොතිබුණි. ඒනිසා මූල්‍ය අංශය මගින් අදාළ දත්ත ලබා දෙනු ලැබේ. | ජීව ගණක කාර්යයෙහි ඵලදායී ක්‍රියාකාරීත්වය කළමනාකාරීත්වය විසින් සහතික කළ යුතුය |
| (ඇ.) ප්‍රතිරක්ෂණ හිමිකම් ක්‍රියාවලිය හැසිරවීමට සහ ගෙවිය යුතු වගකීම් හඳුනා ගැනීමට අරමුදල සඳහා ලේඛනගත ප්‍රතිපත්තියක් නොතිබුණි. එබැවින්, අරමුදල ප්‍රාථමික දැනුම් දීමේ ලේඛනයෙන් ප්‍රතිරක්ෂණ වගකීම හඳුනාගෙන වාර්තා කරනු ලබයි. | හිමිකම් පියවීම සඳහා නිශ්චිත ලියවිල්ලක් සකසා නොමැති අතර, එය රක්ෂණ ඔප්පුව, හිමිකම් සහ පන්තියේ ස්වභාවය මත රඳා පවතී. සාමාන්‍යයෙන් ප්‍රතිරක්ෂණ දෙපාර්තමේන්තුව හිමිකම් පෑම් නිරවුල් කිරීමට පෙර සඳහන් කළ ලේඛන සහතික කරනු ලැබේ. කෙසේ වෙතත්, ඒ අනුව හිමිකම් පියවීම සඳහා නායක ප්‍රතිරක්ෂණ නියමයන් සහ කොන්දේසි භාවිතා කරනු ලැබේ. | අරමුදලේ ප්‍රධාන කාර්යයන් සඳහා ප්‍රතිපත්ති ස්ථාපිත කිරීම කළමනාකාරීත්වය විසින් සහතික කළ යුතුය. |
| (ඈ) අරමුදලට අනුමත අතිකාල ගෙවීමේ ප්‍රතිපත්තියක් නොමැති අතර අතිකාල ගෙවීම් සඳහා ආයතන සංග්‍රහයේ ඇති විධි විධාන ද අනුගමනය නොකරයි. | අධිකාරය පැවරීම අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලැබේ. අතිකාල අනුමත කිරීම්වල සීමාවන් සඳහන් වේ. ඒ අනුව අධිකාරියේ සීමාවන් මත ආයතනය අතිකාල ගෙවීම් කර ඇත. තවද, ආයතනය විසින් ආයතන සංග්‍රහයේ හි අතිකාල ගෙවීම් සම්බන්ධ විධිවිධාන භාවිතා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොමැත . | |

## 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2008 මාර්තු 25 දිනැති අංක 1542/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 3(1) ඡේදයට අනුව, වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදය සඳහා වන අරමුදල සඳහා රක්ෂණ ඔප්පු නිකුත් කිරීමෙන් අයකර ගන්නා වාරිකය රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යන ගිණුමකට බැර කළ යුතුය. කෙසේ වෙතත්, නිසි නීතිමය ප්‍රතිපාදන නොමැතිව රක්ෂණ සමාගම් වෙත 20% ක කොමිස් මුදලක් ලබා දීමෙන් අනතුරුව මෝටර් නොවන රක්ෂණ ගිවිසුම සඳහා අය කළ වාරිකය අරමුදලට බැර කර ඇත. සමාලෝචිත වර්ෂය සඳහා මෝටර් නොවන රක්ෂණ ගිවිසුම්වලින් කොමිස් ලෙස ලබා දී ඇති මුදල රු. 1,228,933,582 කි. | මෝටර් නොවන දළ වාරිකය (100%) ඉන්වොයිස් කර වාරික ආදායම ලෙස සටහන් කර ඇත. කෙසේ වෙතත්, ප්‍රාථමික රක්ෂණකරුගේ අලෙවිකරණ සහ පරිපාලන පිරිවැය ආවරණය කිරීම සඳහා ජාතික රක්ෂණ භාර අරමුදල විසින් 20% කොමිස් මුදලක් ගෙවිය යුතුය. සාමාන්‍ය සමාගම්වලින් 20% කොමිස් මුදලක් සඳහා බැරපත ලැබෙන අතර ජාතික රක්ෂණ භාර අරමුදල විසින් එය පියවිය යුතුය. ඒ වෙනුවට ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ගෙවිය යුතු බැරපත කොමිස් මුදල පියවීමේ ඉන්වොයිසියෙන් අඩු කර ගැනීමට ඉඩ සලසා ඇත. | වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදය ආවරණය සඳහා වන අරමුදල සඳහා මෝටර් රථ නොවන රක්ෂණ ඔප්පු නිකුත් නිකුත් කිරීමෙන් ලබා ගන්නා වාරික සඳහා කොමිස් ගෙවීමේ නීත්‍යානුකූලභාවය පිළිබඳව සමාගම විසින් ඇගයීමට ලක් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) 2008 මාර්තු 25 දිනැති අංක 1542/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 3(1) ඡේදයට අනුව වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදය සඳහා වන අරමුදල සඳහා රක්ෂණ ඔප්පු නිකුත් කිරීමෙන් අය කරන වාරිකය රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යන ගිණුමකට බැර කළ යුතුය. කෙසේ වෙතත්, මෝටර් රථ රක්ෂණ ඔප්පු සඳහා වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදය ආවරණය කිරීමට රක්ෂණ සමාගම්වලින් අයකර ගන්නා ලද සම්පූර්ණ වාරිකයෙන්, අරමුදල අයකරගෙන ඇත්තේ 12%ක් පමණක් වන අතර ඒ සඳහා නිසි නීතිමය ප්‍රතිපාදන නොමැත. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලට වාරික මුදල් ලැබීම රුපියල් 10,155,796,304ක අඩුවෙන් සඳහන් වී ඇත. | වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සඳහා වන අරමුදල ආරම්භයේ සිට මෝටර් රථ පන්තිය සඳහා ක්‍රියාත්මක කරන ලද Motor XOL විධිවිධානයන් (Arrangements) ජාතික රක්ෂණ භාර අරමුදල විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද අතර , ඒ අනුව මෝටර් පන්තියේ අතිරික්ත අලාභ විධිවිධානය (the motor class Excess of Loss arrangement) (XOL) යටතේ අය කරන වාරිකයේ ප්‍රතිශතය කලින් කලට තීරණය කරන ලදී. අධ්‍යක්ෂක මණ්ඩල තීරණ අංක. 53-16 අනුව වාරික වශයෙන් ලබාගත් මුදල රක්ෂණ සමාගම් විසින් එකතු කරන මුළු වාරිකයෙන් 12% කි. කෙසේ වෙතත්, 12% තීරණය කිරීමට පෙර, එම වසරේම මුළු වාරිකයෙන් 15% ක් ඉල්ලා සිටි අතර, එම තීරණයට කර්මාන්තය විරුද්ධ වීම නිසා එය අවසානයේ 12% දක්වා අඩු විය.2021 දී ජාතික රක්ෂණ භාර අරමුදල හි කළමනාකාරිත්වය XOL විධිවිධානයේ වර්තමාන පරිචය නතර කිරීමට අවස්ථාව ලෙස හඳුනාගත් බැවින්, මෝටර් වාරික එකතු කිරීමේ වර්තමාන භාවිතය වෙනස් කිරිම සහ 2022.04.01 දින සිට බලපැවැත්වෙන පරිදි අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවේ අංක 172-03 ට අනුව පරිදි මෝටර් රථ රක්ෂණ වගකීම 100% ක | වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් කලබල සහ ත්‍රස්තවාදය ආවරණය සඳහා වන අරමුදල සඳහා මෝටර් රථ රක්ෂණ ඔප්පු නිකුත් නිකුත් කිරීමෙන් ලබා ගන්නා වාරික සඳහා කොමිස් ගෙවීමේ නීත්‍යානුකූලභාවය පිළිබඳව සමාගම විසින් ඇගයීමට ලක් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| | වාරික සහිතව භාර ගැනීමට 100% තීරණය කරන ලදී. මෙය ක්‍රියාත්මක කිරීමේදී කර්මාන්තය විරුද්ධ වූ බැවින් තීරණය ක්‍රියාත්මක කිරීම කල් දැමීය. | |
| (ඈ) 2007 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් (සංශෝධිත) පනත සහ 2012 දෙසැම්බර් 21 දිනැති අංක 1791/4 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුව, ශ්‍රී ලංකාව තුළ සාමාන්‍ය (ජීවිත නොවන) ප්‍රතිරක්ෂණවලින් 30% ක කොටසක් අනිවාර්යයෙන්ම අරමුදල තුළ ප්‍රතිරක්ෂණය කළ යුතුව ඇත. කෙසේ වෙතත්, අනිවාර්ය කොටස ප්‍රතිරක්ෂණය කරන ප්‍රතිරක්ෂණකරුවන්ට අරමුදල කොමිස් මුදලක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. අරමුදල විසින් 2017 සිට 2020 වසර දක්වා සාමාන්‍ය රක්ෂණ සමාගම් 13කට පෙර කී අනිවාර්ය කොටස සඳහා ප්‍රතිරක්ෂණ කොමිස් මුදල් ලෙස රු. 6,720,273,899 ක් නිසි නීතිමය ප්‍රතිපාදන නොමැතිව ගෙවා ඇත. | ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ ස්වභාවය සහ භාවිතය අනුව, ශ්‍රී ලංකාවේ ප්‍රාථමික රක්ෂණ සමාගම් විදේශීය ප්‍රතිරක්ෂණ මණ්ඩලය සමඟ තම ප්‍රතිරක්ෂණ ආවරණ සකස් කරමින් සිටින අතර අනිවාර්ය 30% ක ප්‍රතිරක්ෂණ කොටසක් සහිත ජාතික රක්ෂණ භාර අරමුදල කමිටුවට තවත් එක් ප්‍රතිරක්ෂණකරුවකු පමණක් බවට පත් වේ. කෙසේ වෙතත්, ඉහළ අවදානම් ප්‍රතිශතයක් භාරගනු ලබන ප්‍රධාන ප්‍රතිරක්ෂණකරු(lead reinsurer) සමඟ ප්‍රතිරක්ෂණ ගිවිසුම මුලින් එකඟ වී අත්සන් කරන ලදී. ප්‍රතිරක්ෂණ සම්මතයන් අනුව, ප්‍රතිරක්ෂණ කමිටුවේ අනෙකුත් සියලුම ප්‍රතිරක්ෂණකරුවන් එකම නියමයන් සහ කොන්දේසි අනුගමනය කරයි. එබැවින්, ප්‍රතිරක්ෂණ නායකයා විසින් මුලින් එකඟ වනු ලබන කොමිස් ප්‍රතිශතය ජාතික රක්ෂණ භාර අරමුදල විසින් පිළිගත යුතුය. | අනිවාර්ය සියයට 30 ක ප්‍රතිරක්ෂණ ආවරණයෙන් එකතු කරන වාරික සඳහා කොමිස් ගෙවීමේ නීත්‍යානුකූලභාවය සඳහා සමාගම විසින් ඇගයීමට ලක් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මෙම කාල සීමාව තුළ සම්පූර්ණ ගිණුමේ අතිරික්ත අලාභ ප්‍රතිරක්ෂණ කොන්ත්‍රාත්තුව (ව්‍යසනයක් ඇති විය හැකි මට්ටමේ අවදානම්) ((whole account excess of loss re-insurance contract (Risk Catastrophe)) ආවරණය කිරීම සඳහා ප්‍රතිරක්ෂණ ගිවිසුමට එළඹීමට මාස එකොළහක් (11) ප්‍රමාද වී ඇති බව නිරීක්ෂණය වී ඇත. මෙම කාල පරිච්ඡේදය තුළ අරමුදල කිසිදු ප්‍රතිරක්ෂණ ආවරණයක් නොමැතිව 30% ක අනිවාර්ය කොටස සමඟ ඉදිරියට ගොස් ඇත. මෙකී ප්‍රමාද කාල සීමාව තුළ කිසියම් ප්‍රතිරක්ෂණ හිමිකම් පෑමක් සිදු වුවහොත් එය අරමුදලේ ක්‍රියාකාරීත්වයට සෘජුවම බලපානු ඇත. ප්‍රතිරක්ෂණ රෙට්රෝ සැසිය (reinsurance retro cession) සඳහා ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය ප්‍රමාද වීම මෙම ගිවිසුමට එළඹීමේ ප්‍රමාදයට හේතු වී ඇත. | 2019 මාර්තු 15 දිනෙන් ආරම්භව වන වසරක කාලයක් සඳහා 30% අනිවාර්ය ප්‍රතිරක්ෂණ වාරිකය සඳහා ප්‍රතිරක්ෂණ ආවරණය ලබා ගැනීමට අදාළ ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2018 ජූලි 18 වැනි දින ආරම්භ කරන ලදී. ඒ වන විට ජාතික රක්ෂණ භාර අරමුදල පැවතියේ තරුණ කටයුතු, ව්‍යාපෘති කළමනාකරණ සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය යටතේය. | අරමුදල විසින් ගනු ලබන අවදානම කළමනාකරණය කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් නියමිත වේලාවට ප්‍රතිරක්ෂණ ආවරණ ලබා ගත යුතුය |